බුද්ධශාසන අමාත්‍යාංශය

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

147580

ශ්‍රී බු. ව. 2564 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2020

8 ශ්‍රේණිය

විභාග අංකය :

කාලය පැය 01 යි විනාඩි 30 යි.

---

**(i)** කොටසේ ප්‍රශ්න සියල්ලටත් **(ii)** හා **(iii)** කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.

**(i)** කොටසට ලකුණු 40 යි. **(ii)** හා **(iii)** කොටස් සඳහා ලකුණු (15×4) 60 යි.

I කොටස

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. විශාලා මහනුවර ඇති වූ තුන්බිය දුරු කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ දේශනා කළේ කිනම් සූත්‍රය ද ?
   (i) අනත්තලක්ඛන සූත්‍රය යි. (ii) ධම්මචක්කප්පවත්තන සූත්‍රය යි.
   (iii) චූල්ලහත්ථිපදෝපම සූත්‍රය යි. (iv) රතන සූත්‍රය යි.

02. බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වැඩවසන සමයේ සිදු වූ වැදගත් සිදුවීම් අතරින් එකකි.
   (i) ශාක්‍ය කෝලිය යුද්ධය සංසිඳවීම. (ii) කාන්තාවන්ට පැවිද්ද ලබාදීම.
   (iii) මාතෘ දිව්‍යපුත්‍රයාට අභිධර්මය දේශනා කිරීම. (iv) රාහුල කුමාරයා පැවිදිවීම.

03. "යෝ වදතං පවරෝ මනුජේසු" යන ගාථාවෙහි ඇතුළත් වන්නේ .............
   (i) බුදු ගුණ යි. (ii) දහම් ගුණ යි.
   (iii) සඟ ගුණ යි. (iv) තෙරුවන් ගුණ යි.

04. සත්වයන් සසර කතරින් හැමකල්හි එතෙර කරවන බැවින් තිලෝගුරු භාග්‍යවතුන් වහන්සේ .............
   (i) සත්ථා නම් වන සේක. (ii) භගවා නම් වන සේක.
   (iii) බුද්ධ නම් වන සේක. (iv) අරහං නම් වන සේක.

05. බුදුරජාණන් වහන්සේ විසින් බිත්තර වී, වර්ෂා ජලය, වියගහ, නඟුල ආදිය යොදාගනිමින් ධර්මාවබෝධය ලබාදුන්නේ කාහට ද?
   (i) අග්ගික භාරද්වාජ බමුණාට ය. (ii) සුන්දරික භාරද්වාජ බමුණාට ය.
   (iii) කසී භාරද්වාජ බමුණාට ය. (iv) අක්කෝස භාරද්වාජ බමුණාට ය.

06. නුවණ මෙහෙයවා කටයුතු කිරීමේ අගය පිළිබිඹුවන ජාතක කථාව මින් කුමක් ද ?
   (i) සාම ජාතකය. (ii) අපණ්ණක ජාතකය
   (iii) මාතු පෝසක ජාතකය. (iv) තිත්තිර ජාතකය.

07. අනුන් රැවටීමේ චේතනාවෙන් බොරු නොකියා සිටීම .............
   (i) විරමණය යි. (ii) සමාදානය යි.
   (iii) සමෝදානය යි. (iv) නිරෝධය යි.

08. ත්‍රිලක්ෂණය යනු මින් කුමක් ද ?
   (i) සීල, සමාධි, ප්‍රඥා (ii) කාම, රූප, අරූප
   (iii) සුඛ, දුක්ඛ, උපේක්ෂා (iv) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම

09. පුනර්භවය ඇති කරවන මූල සාධකය වන්නේ කුමක් ද ?
   (i) වේදනා (ii) ජාති
   (iii) තණ්හා (iv) මරණ

10. තණ්හාවේ ප්‍රභේද ගණන කීය ද ?

(i) 05 කි. (ii) 02 කි.
(iii) 04 කි. (iv) 03 කි.

11. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පහ හඳුන්වන පොදු නාමය මින් කුමක් ද ?

(i) පංච ස්කන්ධ (ii) පංච කාම වස්තු
(iii) පංච නියාම (iv) පංච නීවරණ

12. අපගේ චරිතය ගොඩනගා ගැනීමට අවශ්‍ය යහපත් ගුණධර්ම පහළොවක් ඉදිරිපත් කර ඇති සූත්‍රය මින් කුමක් ද ?

(i) මෙත්තානිසංස සූත්‍රය (ii) මිත්තානිසංස සූත්‍රය
(iii) කරණීය මෙත්ත සූත්‍රය (iv) පරාභව සූත්‍රය

13. තණ්හාව තුනී කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ප්‍රතිපත්තියකි.

(i) සැහැල්ලු පැවැත්ම (ii) බහු භාණ්ඩිකත්වය.
(iii) කාර්ය බහුලත්වය (iv) මෘදුබව

14. ඉන්ද්‍රිය සංවරය පුහුණුවීම සඳහා වඩාත් හොඳ අවස්ථාව වන්නේ මින් කුමක් ද ?

(i) දන් දීම. (ii) නාට්‍ය බැලීම.
(iii) විනෝද ගමන් යාම. (iv) අටසිල් සමාදන් වීම.

15. කය සහ වචනය සංවර කර ගැනීම නම් .............

(i) භාවනාව යි. (ii) දානය යි.
(iii) සීලය යි. (iv) උපේක්ෂාව යි.

16. "**නිපකෝ**" යනු .............

(i) නුවණ ඇති බව යි. (ii) කීකරු බව යි.
(iii) මානය අඩු බව යි. (iv) පහසුවෙන් පෝෂණය කළ හැකි බව යි.

17. බුදුන් ජීවමාන කාලයේ මගධාධිපති, සේනිය, ධම්මික යන ගෞරව නාම වලින් ජනාදරයට පත්ව සිටි රජතුමා කවු ද ?

(i) කොසොල් රජතුමා (ii) බිම්බිසාර රජතුමා
(iii) ධර්මාසෝක රජතුමා (iv) සුද්ධෝදන රජතුමා

18. භාග්‍යවතුන් වහන්සේ දෙවන, තෙවන, සිව්වන, දාහත්වන සහ විසිවන වස්කාලයන් ගත කළ ආරාමය මින් කුමක් ද ?

(i) ජේතවනාරාමය (ii) නිග්‍රොධාරාමය
(iii) ඉසිපතනාරාමය (iv) වේළුවනාරාමය

19. නුවණැති භික්ෂුණීන් වහන්සේලා අතර අග්‍රස්ථානයට පත් වූ තෙරණිය කවු ද ?

(i) උප්පලවණ්ණා තෙරණිය (ii) යශෝධරා තෙරණිය
(iii) ඛේමා තෙරණිය (iv) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය

20. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාද සටහන තබා ඇතැයි සැලකෙන ස්ථාන ගණන කීය ද ?

(i) 08 කි. (ii) 04 කි.
(iii) 03 කි. (iv) 01 කි.

ලකුණු (02 x 20) = 40

## II කොටස

01. (i) මුසාවාදය හෙවත් අනුන් රැවටීම අංග සතරකින් සම්පූර්ණ වන බව බුදු දහමෙහි ඉගැන්වේ. එම අංග සතර නම් කරන්න. (ලකුණු 05)
    (ii) බොරු කීම සම්බන්ධව අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙහි දැක්වෙන දිය බඳුන් උපමාව ගෙනහැර දක්වන්න. (ලකුණු 10)

02. (i) "**සබ්බේ සංඛාරා අනිච්චාති**"........... මෙම ගාථාව නිවැරදිව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 05)
    (ii) ඉහත ගාථාවෙහි අර්ථය ලියා "**සබ්බේ සංඛාරා**" සහ "**අනිච්ච**" යන පද දෙකට ධර්මානුකූල අර්ථ සපයන්න. (ලකුණු 10)

03. (i) ඉන්ද්‍රිය පහ සහ ඒවාට ගොදුරුවන අරමුණු පහ ලියා දක්වන්න. (ලකුණු 05)
    (ii) **පෝනෝභවිකා, නන්දිරාග සහගතා, තත්‍රතත්‍රාභිනන්දිනී** යන තණ්හාවේ ලක්ෂණ තුන ද පැහැදිලි කරමින් ත්‍රිවිධ තණ්හාව පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 10)

04. (i) උපාසක පුණ්ඩරීක ලක්ෂණ පහ නම් කරන්න. (ලකුණු 05)
    (ii) ශ්‍රද්ධාවන්ත බව හා සිල්වත් බව පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 10)

## III කොටස

05. (i) සිංහලයට නගන්න.
    1. නමෝතස්ස මහේසිනෝ
    2. මය්හං නමත්‍ථු පච්චේක බුද්ධානං
    3. අම්හාකං නමත්‍ථු සබ්බ ධම්මානං
    4. අහං තං සම්බුද්ධං සරණං ගච්ඡාමි
    5. අහං තං බුද්ධං සිරසා නමාමි (ලකුණු 05)

    (ii) පාලියට නගන්න.
    1. සියලු රහතන් වහන්සේලාට මාගේ නමස්කාරය වේවා !
    2. ඔබට යහපතක් වේවා !
    3. ඔවුහු ත්‍රිවිධ රත්නය නමදිති.
    4. ගෙතෙම බුදුරදුන් සරණ යයි.
    5. ඒ භාගවතුන් වහන්සේ මෙසේ ද ලෝකවිදූ නම් වන සේක. (ලකුණු 02 x 05 = 10)

06. කෙටි පිළිතුරු සපයන්න.
    (i) පව් නොකිරීම සඳහා පෙළඹවීම ඇති කරවන චෛතසික දෙක නම් කරන්න.
    (ii) පනස් දෙකක් වන චෛතසිකයන්ගේ පොදු ලක්ෂණ හතරකි. ඒ මොනවාද ?
    (iii) සිතේ සහ සිතිවිලිවල සම්බන්ධතාවය පැහැදිලි කෙරෙන සරල උදාහරණයක් දක්වන්න.
    (iv) සිත උපදින තැන් හෙවත් වස්තු හයකි. ඉන් තුනක් නම් කරන්න.
    (v) අඤ්ඤසමාන රාශියට අයත් චෛතසික 13 බෙදී යන අයුරු දක්වන්න. (ලකුණු 03 x 05 = 15)

## බුද්ධශාසන අමාත්‍යාංශය
## බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

### ශ්‍රී.බු.ව 2564 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2020

**08 - ශ්‍රේණිය** **පිළිතුරු පත්‍රය**

(I) කොටසේ ප්‍රශ්න සියල්ලටත් (II) හා (III) කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.

(I) කොටසට ලකුණු 40 කි. (II) හා (III) කොටස් සඳහා ලකුණු (15 × 04) 60 කි.

මූලාශ්‍රය :- 08 ශ්‍රේණිය පෙළ පොත

### I කොටස

**01. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න**

| ප්‍රශ්න අංකය | පිළිතුර | පිටු අංකය | ඡේදය/ ගාථාව/ පාඨය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | (IV) රතන සූත්‍රය යි. | 02 | 04 | 02 |
| 02 | (I) ශාක්‍ය කෝලිය යුද්ධය සංසිඳවීම. | 03 | 01 | 02 |
| 03 | (I) බුදු ගුණ යි. | 04 | 02 | 02 |
| 04 | (I) සත්ථා නම් වන සේක. | 04 | 04 | 02 |
| 05 | (III) කසී භාරද්වාජ බමුණාට ය. | 05 | 05 | 02 |
| 06 | (II) අපණ්ණක ජාතකය. | 10<br>12 | | 02 |
| 07 | (I) විරමණය යි. | 15 | 05 | 02 |
| 08 | (IV) අනිත්‍ය, දුක්ම, අනාත්ම | 22 | 01 | 02 |
| 09 | (III) තණ්හා | 23 | 06 | 02 |
| 10 | (IV) 03 කි. | 24 | 05 | 02 |
| 11 | (II) පංච කාම වස්තු | 25 | 01 | 02 |
| 12 | (III) කරණීය මෙත්ත සූත්‍රය | 27 | 01 | 02 |
| 13 | (I) සැහැල්ලු පැවැත්ම | 29 | 03 | 02 |
| 14 | (IV) අටසිල් සමාදන් වීම. | 30 | 01 | 02 |
| 15 | (III) සීලය යි. | 30 | 02 | 02 |
| 16 | (I) නුවණ ඇති බව යි. | 30 | 02 | 02 |
| 17 | (II) බිම්බිසාර රජතුමා | 32 | 01 | 02 |
| 18 | (IV) වේළුවනාරාමය | 34 | 02 | 02 |
| 19 | (III) ඛේමා තෙරණිය | 34 | 04 | 02 |
| 20 | (II) 04 කි. | 41 | 03 | 02 |

### II කොටස

| ප්‍රශ්න අංකය | | පිළිතුර | පිටු අංකය | ඡේදය/ ගාථාව/ පාඨය | ලකුණ |
|---|---|---|---|---|---|
| 01 | (I) | 1. ඇත්තක් නොවීම<br>2. රචවන සිත<br>3. ඒ පිණිස උපක්‍රම යෙදීම<br>4. එයින් රැවටීමට ලක්වීම | 13 | 02 | 0 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (II) | 1. පා දෝවනය කරන භාජනයේ වතුර ටිකක් ඉතිරි කර ඒ දෙස බලන්න යයි රාහුල හිමියන්ට කී බුදුරජාණන් වහන්සේ බොරු කීමේ ලජ්ජා නැති අයගේ පැවිද්ද මේ ඉතිරි වූ ජලය මෙන් ස්වල්ප යයි වදාළ සේක.<br>2. ඉතිරි වතුර ටිකද ඉවත දැමූ බුදුරජාණන් වහන්සේ දැන දැන බොරු කීමෙහි ලජ්ජා නැති තැනැත්තාගේ පැවිද්ද මේ වතුර ටික මෙන් ඉවත දමන ලද යැයි වදාළ සේක.<br>3. ඒ ජලය තිබූ බඳුන මුනින් අතට නැමූ බුදුරජාණන් වහන්සේ එය පෙන්වා දැන දැන බොරු කීමෙහි ලජ්ජා නැති නම් ඔහුගේ පැවිද්ද මේ භාජනය මෙන් මුනින් නමනා ලද්දේ යයි වදාළහ.<br>4. නැවත එම භාජනය උඩුකරු කළ බුදුන් වහන්සේ එම හිස් බඳුන පෙන්වා දැන දැන බොරු කීමෙහි ලජ්ජා නැති තැනැත්තාගේ ජීවිත මේ භාජනය මෙන් හිස් වූවකැයි දේශනා කළහ.<br>මෙම දිය බඳුන උපමා කොට සෙල්ලම් පිණිසවත් බොරු නොකියන ලෙස රාහුල හිමියන්ට උපදෙස් දුන්හ. | 14<br>15 | 5-7<br>01 | |
| 02 | (I) | සබ්බේ සංඛාර අනිච්චා ති - යදා පඤ්ඤාය පස්සති<br>අථ නිබ්බින්දති දුක්ඛෙ - ඒස මග්ගෝ විසුද්ධියා | 18 | 02 | 05 |
| | (II) | (යමෙක්) සියලු සංස්කාර අනිත්‍ය ලෙස යම් කලෙක විදර්ශනා නුවණින් දකී ද එවිට (ඔහු) දුක ගැන කලකිරෙයි. (ඒ නිසා චතුරාර්ය සත්‍යය අවබෝධ කරගනී) විසුද්ධියට හෙවත් නිවනට මෙය මාර්ගයයි.<br>1. සබ්බේ සංඛාරා - කාම භවයේත්, රූප භවයේත්, රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පහ සංඛාර හෙවත් සංස්කාර යනුවෙන් හඳුන්වා ඇත. එසේ හඳුන්වා ඇත්තේ ස්කන්ධවලට අයත් සියල්ල හේතූන් නිසා ඇතිවන හෙයිනි.<br>2. අනිච්ච - මේ සංස්කාරවල ඇතිවී නැතිවීම යි. ඇතිව නැතිවන හෙයින් අනිත්‍ය යි. | 19 | 01<br>-<br>04 | 10 |
| 03 | (I) | 1. චක්ඛු ඉන්ද්‍රිය (ඇස) - රූපය<br>2. සෝත ඉන්ද්‍රිය (කණ) - ශබ්ද<br>3. ඝාන ඉන්ද්‍රිය (නාසය) - ගන්ධය<br>4. ජිව්හා ඉන්ද්‍රිය (දිව) - රස<br>5. කාය ඉන්ද්‍රිය (කය/සම) -ස්පර්ශය | 24 | 07 | 05 |
| | (II) | පෝනෝභවිකා - තණ්හාව පුනර්භවය ඇතිකරයි.<br>නන්දිරාග සහගතා - සතුට හා ඇලීම යන දෙකින් යුක්තය.<br>තත්‍ර තත්‍රාභිනන්දිනී - ඒ ඒ තැන හෙවත් ලැබෙන ලැබෙන අරමුණුවල හා උපදින භවයන්හි අභිනන්දනය හෙවත් විශේෂයෙන් සතුටු වේ.<br>1. කාම තණ්හා - කාමයන්ට හෙවත් කාම වස්තූන්ට ඇතිවන තණ්හාව යි.<br>2. භව තණ්හා - භවයට හෙවත් නැවත නැවත හටගැනීමට, නැවත නැවත ඉපදීමට ඇති තණ්හාව යි.<br>6. විභව තණ්හා - මරණයෙන් සියල්ල අවසන් වේයයි සිතා, මරණයට පළමුව මේ භවයේදී ම සියලු සැප සම්පත් විඳීමට ඇතිවන ආසාව විභව තණ්හාව යි. | 24 | 01<br>-<br>04 | 10 |
| 04 | (I) | 1. ශ්‍රද්ධාව ඇත්තෙකි.<br>2. සිල්වත් අයෙකි.<br>3. සුබ අසුබ නිමිති පිළිනොගන්නෙකි.<br>4. කර්මය පිළිගන්නෙකි.<br>5. තෙරුවන් හැර වෙනත් සරණක් නොපතන්නෙකි. | 59 | 06 | 05 |
| | (II) | ශ්‍රද්ධාවන්ත බව -<br>තෙරුවන් සරණ යන්නා ශ්‍රද්ධාවන්තයෙකි. නමට පමණක් නොව සැබෑ අර්ථයෙන් ම තෙරුවන් සරණ යාම ශ්‍රද්ධාවන්ත බවයි. සැබෑ ශ්‍රද්ධාවන්තයා මුදල් සෙවීමේ අරමුණින් මැරීම සඳහා සතුන් ඇතිකරන්නේ නැත. විනෝදය සඳහාවත් මත්පැන් පානය කරන්නේ නැහැ. ප්‍රශ්නයක් ඇතිවුනාම කටුක වචන පාවිච්චි කරමින්, අඬදබරවලට පැටලෙමින් මහා විනාශයක් කරගන්නේ නැහැ. අසනීප සුවකර ගැනීමට යාඥාවලට සහභාගී වන්නේ නැහැ. බුදු දහමට අනුව ම තමන්ගේ ජීවිතය ගතකරයි.<br><br>සිල්වත් බව -<br>බෞද්ධයකු වශයෙන් අවම වශයෙන් පංච ශීලය නිවැරදිව ආරක්ෂා කරගතයුතුය. කය | 60<br>61 | 2-6<br>01 | 10 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | හා වචනය සංවර කර ගැනීම සීලය ලෙස හඳුන්වයි. පංච ශීලය මගින් කය සහ වචනය සංවර වේ. ප්‍රාණ ඝාතයෙන්, සොරකමින්, කාම මිථ්‍යාචාරයෙන්, බොරුකීමෙන්, මත්පැන් භාවිතයෙන් වැළකීම පංච ශීලයයි. මෙම අයහපත් චර්යාවන්ගෙන් වෙන්ව ජීවත්වීම සිල්වත් බවයි. | | | |

III - කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 05 | (I) | 1. ඒ මහ සෘෂින් වහන්සේට නමස්කාර වේවා.<br>2. පසේ බුදුරජාණන් වහන්සේලාට මාගේ නමස්කාරය වේවා.<br>3. සියලු ධර්මයට අපගේ නමස්කාරය වේවා.<br>4. මම ඒ සම්බුදුරජාණන් වහන්සේ සරණ යමි.<br>5. මම ඒ සම්බුදු රජාණන් වහන්සේට හිසින්(සිරස නමා) නමදිමි | 45<br>49 | 02<br>02 | 05 |
| | (II) | 1. මය්හං නමත්ථු සබ්බ අරහන්තානං<br>2. තුය්හං/තව සොත්ථි අත්ථු<br>3. තේ රතනත්තයං නමන්ති<br>4. සෝ බුද්ධං සරණං ගච්ඡති<br>5. සෝ භගවා ඉතිපි ලෝකවිදූ | 44<br>45<br>49 | 04<br>03<br>03 | 10 |
| 06 | I | හිරි සහ ඔත්තප්ප | 51 | 02 | 03 |
| | II | 1. පෙර පසු නොවී සිත සමගම ඉපදීම<br>2. පෙර පසු නොවී සිත සමගම නැතිවීම<br>3. සිත ලබාගන්නා අරමුණ ම ලබාගැනීම<br>4. සිත උපදින වස්තුවෙහි ම ඉපදීම | 51 | 03 | 03 |
| | III | පහනක් දල්වන විට අඳුර දුරුවීමත්, ආලෝකය පැතිරීමත් පෙර පසු නොවී එකටම සිදුවන්නාක් මෙනි. | 52 | 01 | 03 |
| | iv | 1.ඇස, 2. කණ, 3. නාසය, 4. දිව, 5.සම, 6. මනස | 52 | 05 | 03 |
| | v | 1. සබ්බචිත්ත සාධාරණ චෛතසික - 07<br>2. ප්‍රකීර්ණක චෛතසික - 06 | 53 | 01 | 03 |